ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 18/05/2021. |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : ඩබ්. එම්. පී. සී. වර්ණසූරිය මහතා ඇතුළු පිරිස,
"ප්‍රභා", දෙල්ගහවත්ත,
අඩරපනේ, මහරච්චිමුල්ල.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
කම්කරු වෘත්තීය සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යාංශය,
දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට, කොළඹ 05.

02. කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පැමිණිලි අංකය : **HRC/3267/17**

පැමිණිලිකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු ඇතුළු පිරිස 2017-10-17 වන දින සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සදහන් කර ඇත්තේ, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි II තනතුරේ පවතින පුරප්පාඩු 89 ක් සදහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත 89 වන ස්ථානයේ සිටින සියළුම අයදුම්කරුවන් (16 දෙනකු) සම්මුඛ පරීක්ෂණයට කැදවන ලද බවත්, නමුත් අදාළ තනතුරට බඳවා නොගත් බවත්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් හෝ නිසි උපදෙසක් ලබාගැනීම සිදු නොකළ බවත් සදහන් කර ඇත.

එසේම සුදුසුකම් පරීක්ෂා කරන අවසාන දිනය වන 2016-12-14 දින දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 241 ක් අතරින් කම්කරු නිලධාරින් බඳවා ගැනීමේ පටිපාටිය අනුව සීමිත පදනම මත බඳවා ගත හැකි පුරප්පාඩු 108ක් මත ගැසට් පත්‍රයේ සඳහන් සියළු සුදුසුකම් සපුරා තිබීම යන සාධාරණ හේතු පදනම් කරගනිමින් කම්කරු නිලධාරි සීමිත විභාගය සමත් වී 89 වන ස්ථානයේ සිටින නිලධාරින් 16



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දෙනාද කම්කරු නිලධාරීන් ලෙස පළමු වටයේදීම බඳවා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලෙසට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

මෙම පැමිණිලිකරුවන් විසින් තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් මීට පෙර අවස්ථා 03කදී කම්කරු දෙපාර්තමේන්තුවේ 2001 හා 2002 වර්ෂ වල කම්කරු නිලධාරීන් බඳවා ගැනීමේ දී එම අවස්ථාවේ සිටි සම ලකුණු ලබා ගත් නිලධාරීන් 32 ක් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනුකරන ලද පැමිණිලි අංක HRC/L/2/1868/01 සහ HRC/L/2/1685/01 සහ HRC/L/2/1866/01 දරණ පැමිණිලි සමථයකට පත්වීම මත එම පුරප්පාඩු නොමැති වුවද, ඉදිරියේ පවතින පුරප්පාඩු ඇති වීම මත බඳවා ගෙන ඇති බවත් සඳහන් කර ඇත. (පැමිණිලිකරුවන් විසින් 2001 හා 2002 වර්ෂ වල කොමිෂන් සභාවේ සමථය මත පත්වීම් ලබා ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් ලේඛණ දෙකක් ඉදිරිපත් කර ඇත.

එසේම 2013 වර්ෂයේ සහකාර කම්කරු කොමසාරිස්වරුන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 09 දෙනෙකුට පමණක් වන නමුත්, පසුව සුදුසුකම් සම්පූර්ණ කරන අවසාන දින දක්වා වන පුරප්පාඩු පදනම් කරගනිමින් මෙම බඳවා ගැනීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියක් මත සියලු දෙනා බඳවා ගෙන ඇති බවද දක්වා ඇත.

2015 වර්ෂයේ සහකාර කම්කරු කොමසාරිස් බඳවා ගැනීමේදීද සුදුසුකම් සපුරන අවසාන දින දක්වා වන පුරප්පාඩු පදනම් කරගනිමින් මෙම බඳවාගැනීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බවද දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරුවන් 16 දෙනෙකු, සම ලකුණු ලබා ගැනීම මත මෙම පැමිණිලිකරුවන් බඳවා ගෙන නොමැති බවත්, ඉහත කරුණු සලකා බලා පැමිණිලිකරුවන්ට නීතිමය සහන ලබා දෙන ලෙසත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

ඉහත වගඋත්තරකරු විසින් මෙම පැමිණිල්ලට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙත කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, කම්කරු නිලධාරී II තනතුරට පත්කිරීමේ තරග විභාගය සඳහා නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ 6 වන වගන්තිය අනුව කිසියම් අපේක්ෂක සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගෙන ඇති අවස්ථාවකදී කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසා ඉන් ලබාදෙනු ලබන උපදෙස් හා තීරණය අනුව ක්‍රියා කරන බවත්, මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසා පිළිතුරු ලැබී ඇති බවත්ය.

ඒ අනුව සීමිත තරග විභාගයට පෙනී සිට ලකුණු 131 ලබා ගත් 89 වන කුසලතාවයේ සිටින නිලධාරීන් 16 දෙනෙකු සිටින බවත්, උපාධියක් සහිත අපේක්ෂකයන් (විවෘත අයදුම්කරුවන් ලෙස) ඉල්ලුම්කර 94වන කුසලතාවය ලබා ඇති සම ලකුණු ලබා ගත් 24 දෙනෙකු සිටින බවත්, ඒ අනුව බාහිර හා අභ්‍යන්තර II

වන ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් සඳහා සම ලකුණු ලබා ගත් දෙපාර්ශවයෙන්ම අයදුම්කරුවන් 40 දෙනකු සිටින බවත්, වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

ලකුණු 131ක් ලබා 89 කුසලතාවය ලබා ගත් සීමිත නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇතත් 94වන කුසලතාවය ලබා ගත් 24 දෙනා විවෘත සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත්, තවද සීමිත නිලධාරීන් ඔවුන් බඳවා ගන්නා ලෙස ලිඛිතව ඉල්ලා ඇති නමුත්, විවෘත අයදුම්කරුවන් එවැනි ඉල්ලීමක් කර නොමැති බවද අදාළ වගඋත්තරකරු කොමිෂන් සභාවට කරුණු දක්වා සිටියි. ඒ අනුව දෙපාර්ශවය සම ලකුණු ලබා ඇති නිසා සීමිත අයදුම්කරුවන් පමණක් සේවයට බඳවා ගැනීමට නොහැකි බවත්, එමගින් විවෘත අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදු වන බවත්, වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

16 දෙනකුගෙන් යුත් පැමිණිලිකරු ඇතුළු පිරිස සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 131 ලබා 89 වන කුසලතාවයක් හිමිකරගෙන ඇති නමුත් II වන ශ්‍රේණියේ කම්කරු පත්වීම් ලිපි ලැබී නොමැති බව නිරීක්ෂණය වේ. තවද 2016-12-14 දින දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 241 ක් ඇති බවට කරුණු අනාවරණය වී ඇත. ඒ අනුව 94 වන කුසලතාවය ලබා ගත් විවෘත අයදුම්කරුවන් 24 දෙනා සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැත. තවද ඔවුන්ව බඳවා ගන්නා ලෙසට ලිඛිතව කම්කරු කොමසාරිස්ගෙන් ඉල්ලීමක් කර නොමැති බවද වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව තහවුරු වේ.

2016 ගැසට් නිවේදනයට අනුව, II වන ශ්‍රේණියේ කම්කරු නිලධාරී පුරප්පාඩු 241ක් ඇති අතර, ඒ අනුව කම්කරු නිලධාරී පුරප්පාඩු විවෘත සහ සීමිත අයදුම්කරුවන් 40 දෙනා බඳවා ගැනීමට පුරප්පාඩු ඇති බව පැමිණිලිකරුවන් හා වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම තුලින් පැහැදිලි වේ.

2017-11-15 වන දින පැවැති විමර්ශනයේදී අදාළ වගඋත්තරකරුවන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැමිණිලිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීමට එකගත්වය පළ කර ඇත.

**නිගමනය :-**

2016-11-11 ගැසට් නිවේදනය අනුව II වන ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් 202 ක පුරප්පාඩුවක් පවතින බවත්, උතුරු නැගෙනහිර පළාත් සඳහා දෙමළ මාධ්‍යයෙන් විවෘත සහ බාහිර අයදුම්කරුවන් 24 දෙනකුට පත්වීම් ලබා දී ඇත. ඉතිරි 178 දෙනාගෙන් 50% බැගින් විවෘත අයදුම්කරුවන් 89 දෙනකු සඳහා පුරප්පාඩු වෙනුවෙන් 83 දෙනකු බඳවාගෙන ඇති බවත්, 06 දෙනකුගේ පුරප්පාඩු පවතින අතර, බාහිර අයදුම්කරුවන් 89 දෙනාගෙන් 76 දෙනකු බඳවාගෙන පුරප්පාඩු 13 ක් ඉතිරිව ඇත. තවද සුදුසුකම් පරීක්ෂා කරන අවසාන දිනය වන 2016-12-14 දින වන විට II වන ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් 241 දෙනකුගේ පුරප්පාඩු පවතී. එසේ තිබියදීත් මෙම කම්කරු නිලධාරීන් බඳවා නොගැනීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුවන්ගේ මූලික

අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඉහත දෙපාර්ශවයේ කරුණු අධ්‍යනය කිරීමේදී කම්කරු නිලධාරී II වන ශ්‍රේණියේ පුරප්පාඩු 2016-12-14 වන දිනට 241ක් තිබෙන බැවින්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කොට සම ලකුණු ලබා ගත් 16 දෙනා හටද II වන ශ්‍රේණියේ කම්කරු නිලධාරී තනතුරු ලබා දෙන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.06.21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmugana...

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා,
කම්කරු වෘත්තීය සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යංශය
දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට,
කොළඹ 05.

02. සභාපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නො : 177, නාරාහේන්පිට,
කොළඹ 05.

B/